ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 08 දින ජාතික බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු පුනරාවර්තන ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 28.75 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 28.15 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 0.60 ක් හෙවත් සියයට 2.08 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

---

වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා වන මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශවීමේ ව්‍යාපෘතිය සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් රු. මිලියන 38.00 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 37.96 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් රු. මිලියන 0.04 ක් ඉතිරිවී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට අදාළ විෂය අංක 29901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 3.00 | 2.73 | 1.20 | 2.03 | 10.00 | 7.33 |

## 2.3 විගණන නිරීක්ෂණය

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය |
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |
| ලංසු විවෘත කිරීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය |

**3.2 විසර්ජන ගිණුම**

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

2016 අයවැය යෝජනාවකට අනුව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශවීමේ ව්‍යාපෘතියක් 2016 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා වූ වර්ෂ දෙකක කාලය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 100 ක් වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය භෞතික පහසුකම් ගොඩනැංවීම යටතේ ව්‍යාපෘතිය අවසාන වනතෙක් වාණිජ මණ්ඩලයට අයත් ගොඩනැඟිල්ලේ බිම් මහල කුලී පදනම මත ලබාගෙන තිබුණි. 2016 මැයි 15 දින සිට 2018 මැයි 14 දින දක්වා වූ වර්ෂ දෙකක කාලපරිච්ඡේදයක් සඳහා මාසයකට රු.175,000 ක කුලියකට මෙම පරිශ්‍රය ලබාගෙන තිබුණි. නමුත් මෙම පරිශ්‍රය 2017 සැප්තැම්බර් 08 දින වනවිටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර 2017 මැයි දක්වා කුලී වශයෙන් රු.මිලියන 2.43 ක් ගෙවා තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ හා ලීබඩු මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 3.88 ක් වැය කර තිබුණද, ව්‍යාපෘතියේ කටයුතු පවත්වා ගෙන යාමට ඉහත පරිශ්‍රය ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් එම භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සර්වර් (server) යන්ත්‍රය මිලදී ගැනීම, පද්ධතිය ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය හා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය අතර 2016 දෙසැම්බර් 30 දින අවබෝධතා ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. ඒ අනුව අදාල මිලදී ගැනීම, ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීමේ ක්‍රියාවලිය සඳහා රු. මිලියන 32.50 ක් ගෙවා තිබුණු අතර, ගිවිසුම අත්සන් කළ දින සිට මාස 06 ක් ඇතුළත මිලදී ගැනීමේ කටයුතු නිම කිරීමට ගිවිසගෙන තිබුණද 2017 ජූනි 28 වන විටත් අදාල මිලදී ගැනීම් සඳහා මිල කැඳවීම් හෝ සිදු කර නොතිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂයය අංක 29901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂය රු.139,410 ක් වූ අතර එය වර්ෂ 07ක කාලයක සිට පැවත එමින් තිබුණි. එම හිඟ හිටි ණය ශේෂය අය කර ගැනීමට කාර්යාලය විසින් අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම, ආයතනයේ සංවිධාන ව්‍යුහය, කාර්ය මණ්ඩල විස්තර, අයවැය ලේඛනය, අභ්‍යන්තර විගණන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර පිළියෙල කර නොතිබුණි.

**3.4.2 අභ්‍යන්තර විගණනය**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලයේ කටයුතු පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

2000 වර්ෂයේ දී මිලදී ගත් රු.3,126,957 ක් පිරිවැය වූ මෝටර් රථයක් සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට 2017 සැප්තැම්බර් 08 දින වන විටත් නිෂ්කාර්යව පැවතුනි.

**3.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට යොමුව.** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත | අනුයෝජිතයින් ලියාපදිංචි කිරීමට අදාලව 175(5) වගන්තිය ප්‍රකාරව වලංගු කාලය ඉකුත් වී මාස 06 ක් ඇතුළත නියම කරනු ලබන අධිභාරයක් ගෙවීම මත ලියාපදිංචිය අළුත් කිරීමට හැකියාව පවතී. නියෝග 58 හි 10 (ii) ප්‍රකාරව ලියාපදිංචි කාලය ඉකුත් වී සති 02 ක් තුළ අළුත් කිරීමේ ගාස්තු ගෙවා නැත්නම් නාම ලේඛනයෙන් ඉවත් කළ යුතු බැවින් මෙම පරස්පරතාවය නිසා නියෝග 58 හි 10 (ii) ප්‍රකාරව නම ඉවත් කළ නොහැකි වී තිබුණි. |
| (ආ) | 2006 අංක 01 දරන බුද්ධිමය දේපළ නියෝග | නියෝග 58 යටතේ 11 වගන්තිය අනුව අනුයෝජිත නාම ලැයිස්තුවක් ප්‍රසිද්ධ කරවීමට හා අනුයෝජිතයින් අනුයෝජිත ලේඛනයෙන් ඉවත් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ කරවීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රියා කළ යුතුය. එසේ වුවද, ඉවත් කරන ලද අනුයෝජිත ලේඛනයක් වෙබ් අඩවියේ දක්වා නොතිබුණි. තවද, වෙබ් අඩවියේ වූ ලියාපදිංචි අනුයෝජිත ලේඛනයේ වලංගු කාලය ඉක්මවා ගිය අනුයෝජිතයින් ද ඇතුළත් වී තිබුණි. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කාර්යාලය සතු වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

**3.7 අවිධිමත් ගනුදෙනු**

-------------------

ආයතනය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**පරිගණක, උපාංග හා ලී බඩු උපකරණ මිලදී ගැනීම**

--------------------------------------------------

මැඩ්රිඩ් ව්‍යාපෘතියේ කටයුතු සඳහා ලැප්ටොප් පරිගණක 05ක්, පරිගණක 08ක්, මුද්‍රණ යන්ත්‍ර 06 ක් හා ලී බඩු උපකරණ රු.මිලියන 3.72 කට මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2016 දෙසැම්බර් 28 දිනට පෙර පරිගණක හා උපාංග සපයන ලෙස සැපයුම්කරුට දන්වා තිබුණද ඒවා 2016 දෙසැම්බර් 30 දින සිට 2017 මාර්තු 27 දක්වා කාලය තුළ ලැබී තිබුණි.

(ii) ලැප්ටොප් පරිගණක හැර ඉතිරි භාණ්ඩ පිරිවිතරවලට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු විසින් 2016 දෙසැම්බර් 28 දින සහතික කර තිබීම මතභේදයට තුඩු දෙන්නක් විය.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව අදාල ආයතන සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹී නොතිබුණි.

(v) මෙම මිලදී ගැනීම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත්ව තිබේද යන්න තහවුරු කර නොගැනීම හේතුවෙන් ලැප්ටොප් යන්ත්‍ර 05 ක් සඳහා වූ රු.927,500 ක මුදල 2017 වර්ෂයේ ප්‍රතිපාදනවලින් ගෙවීමට සිදුවී තිබුණි.

**3.8 කළමනාකරණ දුර්වලතා**

------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) අනුයෝජිතයින් ලියාපදිංචි කිරීම හා පරිපාලනය**

--------------------------------------------------

(i) 2006 මැයි 17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අනුයෝජිතයන් බඳවා ගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ විභාගයක් තමන් විසින්ම හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහායෙන් හෝ පැවැත්වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකියාව ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල විභාගය පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු පමණක් අනුයෝජිතයෙක් ලෙස පත් කර ගෙන තිබුණි.

(ii) අනුයෝජිතත්වයක් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුවට වඩා අළුත් කිරීමේ ගාස්තුව ඉහල අගයක් ගෙන තිබූ හෙයින් ලියාපදිංචි වී ඇති අනුයෝජිතයෙකු වසර 03 කට පසු ලියාපදිංචිය අළුත් කිරීම වෙනුවට නැවත අළුතෙන් ලියාපදිංචි වීම කෙරෙහි යොමුවීමේ ප්‍රවනතාවයක් ඇතිවී තිබුණි. එමනිසා ගාස්තු සංශෝධනය සම්බන්ධයෙන් ආයතනයේ අවධානය යොමු කළ යුතුව තිබුණි.

(iii) අනුයෝජිතයින් හරහා කාර්යාලය වෙත ලැබෙන වෙළඳ, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචියට අදාළ ලිපි ලේඛනවල නිවැරදි හා සම්පූර්ණ බව සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කර නොතිබුණි. ඒ හේතුවෙන් ඔවුන් හරහා ලැබෙන ලිපි ලේඛනවල අඩුපාඩු සම්පූර්ණ කිරීමට කාර්යාලයේ නිලධාරීන්ට සිදුවීමෙන් එය කාර්යාලයේ කාර්යක්ෂමතාවයට හා අනුයෝජිතයින් පත්කර ගැනීමේ අරමුණ කෙරෙහිද අහිතකර ලෙස බලපා තිබුණි.

**(ආ) ආදායම් සංකේතයක් ලබා ගැනීම**

බුද්ධිමය දේපළ අරමුදලෙන් උපයන ආදායමින් 1/3 ක කොටසක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරනු ලබන නමුත් ඒ සඳහා ආදායම් සංකේතයක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකි වී තිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 06 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 66 | 45 | 21 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 14 | 01 |
| | එකතුව | **98** | **70** | **28** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

කාර්යාලයේ වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචිය සඳහා ලැබෙන අයදුම්පත් සම්බන්ධව පරීක්ෂාවන් සිදු කරන බුද්ධිමය දේපල තාක්ෂණික නිලධාරීන්, බුද්ධිමය දේපල නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු 16 ක් පැවතුනි. මෙම පුරප්පාඩු කාර්යාලයේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.